## 1.1 හැඳින්වීම

සියලුම ලලිත කලාවන් සුවිශේෂීය. එකී ලලිත කලාවන් අතුරින් නර්තන කලාවද සුවිශේෂී වේ. මන්ද කිසිදු උපකරණයක පිහිට නොලබා ශරීරය පමණක් උපයෝගී කරගනිමින් ප්‍රභවය ලැබූ ලෝකයේ පැරණිතම කලා මාධ්‍යය නර්තනය වන බැවිනි. එය කවදා කෙසේ ප්‍රභවය ලැබුවේද යන්න සමකාලීන සාධක මත සනාථ කළ නොහැකි හුදු උපකල්පනයන්ට පමණක් සීමා වෙතත් , මානව වර්ගයාගේ ආරම්භය සිදු වූයේ කවදාද? කොතැනකදීද? නර්තන කලාවේ ප්‍රභවයන් ඒ හා සමානවම සිදු වූවා යැයි අපට අනුමාන කළ හැකිය.

මානව වර්ගයාගේ පරිණාමයත් සමඟම, නර්තන කලාවද විවිධ යුගයන්හිදී කෙමෙන් පරිණාමය වෙමින්, අද්‍යතන ස්වරූපය දක්වා වර්ධනය වී ඇත. ''නර්තනය'' යන්න නිශ්චිත ලෙස අරුත් ගැන්වීමට විවිධ පුද්ගලයන් , විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉංග්‍රීසියෙන් Dance සහ Dancing යන පදය ව්‍යවාරයට පැමිණෙන්නේ ජර්මන් බසෙහි Danson යන පදයෙනි. එහි අර්ථය ප්‍රසාරණය හෙවත් දිගහැරීමයි. ඒ අනුව ලොව සෑම නර්තනයක්ම ජනිත වී ඇත්තේ ප්‍රසාරණයන් හා විශ්‍රාන්තියෙනි. නර්තනය යනු කෙනෙකුගේ මනෝභාවයන් රිද්මයානුකූල පරිපාලිත චලන මඟින් ප්‍රකාශයට පත් කිරීම බව L.Anold Masken මහතා "The Dance Story" නම් කෘතියෙහි සඳහන් කර තිබේ.

මිනිස් ශරීරය ස්වභාවයෙන්ම රිද්මය, තාලය සහ චලනය කෙරෙහි නිසඟ ලෙසින්ම පොළඹවන සුලුය. මනුෂ්‍ය වර්ගයා, මෙලොවට බිහිවූ දා පටන්ම ඔහු හා බැඳී එන්නා වූ එක් දෙයක් පිළිබඳව අපට නිශ්චිත වශයෙන් සඳහන් කළ හැකිය. එනම් තමාගේ මානසික මෙන්ම සෞන්දර්යාත්මක හැඟීම් උද්දීපනය කරනු සඳහා ඔවුන් විසින් භාවිතා කරන රිද්මයානුකූල අංග චලනයයි. සෑම මානව සමාජයකම හැසිරීම් රටාවේ මූලික අංගය ලෙස සැලකෙන්නේ ශරීර අංගචලනයන්ය. මේ අනුව අපට ගම්‍ය වන්නේ චලනයන් රාශියක එකතුවකින් ''නර්තනය'' නිර්මාණය වන බවයි. මේ ආකාරයට මානව පැවැත්මේ මූලාරම්භයේ පටන් අවධිමත් චලන රටාවන්ගෙන් ආරම්භ වී මානව පරිණාමයත් සමග විධිමත් හා ක්‍රමවත් කලාංගයක් බවට පත්වූ නර්තනය, අද්‍යතනය වන විට විශ්වය පුරා පැතිර පවත්නා වූ ප්‍රසංග කලා මාධ්‍යයක් බවට පත්ව ඇත. මෙලෙස වර්ධනය වූ නර්තන කලාවේ විවිධ රටවල්හි එම රටවලට ආවේණික වන ගති ලක්ෂණ හා අංග චලන, රංග උපක්‍රම, ඇඳුම් පැළඳුම්, වේෂ නිරූපණ ශිල්පයන් ආදියෙන් උපලක්ෂිතව වැඩී තව දුරටත් නූතනයේ තාක්ෂණය හා එක්ව ඉදිරියට ගමන් කරයි.

නර්තනයේ ප්‍රභවය මූලික සංකල්ප නැතහොත් බීජයන් දෙකක් අරමුණු කරගෙන සිදු වූ බව බොහෝ සමාජ හා මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. පූජාර්ථය සහ විනෝදාර්ථය යන එකී පදනම් දෙක මත ප්‍රාථමික අවධියේදී නිරායාස පෙළඹුමෙන් උපන් සීමිත චලන කිහිපයකට පමණක් සීමා වූ නර්තනය, ශිෂ්ටාචාරයේ දියුණුවත් සමඟින් මානව අවශ්‍යතා සමඟ ඉතාමත් සමීප ලෙස බැඳෙමින්, ඒ හා බද්ධ වෙමින් සුවිශේෂී කලාංගයක් ලෙස මුළු ලොව පුරාම ව්‍යාප්ත වන්නට විය.

භූගෝලීය මෙන්ම දේශගුණික සාධකයන්ගේ බලපෑමද කරණ කොට ගෙන එකිනෙකින් වෙනස් වී එක් එක් ජාතීන් හා ජනවාර්ගිකයන් සතුව පවතින, ඔවුන්ගේ අවශ්‍යතාවන් ප්‍රකට කරවන නර්තන ශෛලීන් සංඛ්‍යාව කොපමණ දැයි නිර්ණය කිරිමට නොහැක. අතීතයේ සිට පැවත ආ එම සෑම නර්තනයක්ම නැරඹීමේ ශක්‍යතාවය විරලය. මන්ද එම නර්තන ශෛලීන්ගෙන් සමහරක් මේ වන විට අභාවිත බැවිනි. තවත් ප්‍රමාණයක් මූලික ස්වරූපයට වඩා බෙහෙවින් වෙනස් වී තිබීමයි. කෙලෙස වුවද සංස්කෘතික සාධකයන් කරණ කොට ගෙන එකිනෙකින් වෙනස්ව පෙණුණ ද, ලෝකයේ සියලුම නර්තන එකම අරමුණක් කේන්ද්‍ර කොට ගෙන පවත්වනු ලබන හෙයින් එය එකම මූලයකින් උපන් බවට සැකයක් නැත.

''කවර සංස්කෘතියකට අයත් වුවද නර්තනය, එකී රටෙහි නැතහොත් කොට්ඨාශයෙහි හදවතේ රිද්මයයි. චලනය, වචනයට වඩා ප්‍රබල වන හෙයින් ඔවුන්ගේ හැඟීම්, ප්‍රාර්ථනා, බලාපොරොත්තු සහ ආශාවන් චලනය මාධ්‍යය කොට ගෙන නර්තනය තුළින් විමෝචනය කරයි.''

භූගෝලීය වශයෙන් කලාවන් පෙරදිග හා අපරදිග වශයෙන් මාර්ග දෙකක විහිදී ගිය අතර, නර්තන කලාවද ඊට අනුරූපී ලෙස සැකසී තිබේ. එහිදී පෙරදිග නර්තන කලාවන් ලෙස චීනය, ඉන්දියාව, තායිලන්තය, ඉන්දුනීසියාව, කාම්භෝජය, ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල නර්තන ශෛලීන් අයත් වන අතර අපරදිග නර්තන කලාවන් අතරට යුරෝපීය රටවල් වලින් බිහිවූ නර්තන කලාවන් අන්තර්ගතවේ. එනම් ඇමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, රුසියාව වැනි රටවල්ය.

මෙම පර්යේෂණ නිබන්ධනයේදී ලෝකය පුරා දක්නට ලැබෙන නර්තන ශෛලීන් අතුරින් අපරදිග රටවල්වලට අයත් බටහිර සමාජ නර්තන පිළිබඳ අධ්‍යයනය කරයි. බටහිර සමාජ නර්තන පිළිබඳ අධ්‍යයනය කිරීමේදී එහි මූල බීජයන් අයර්ලන්තයේ තැබෑරුම්වලටත්, යුරෝපයේ "Ballroom" නර්තන ශාලාවලටත්, රුසියාවේ සාර් මාලිගාවටත්, ගෝත්‍රික අභිචාර විධි දක්වාත්

වශයෙන්ද ආර්ථිකමය වටිනාකමක්ද ඒ මත ගොඩ නැගී ඇත. මාධ්‍යය මඟින් මෙන්ම කොළඹ, නුවර, ගාල්ල, නුවරඑළිය ආදී නගරවල කෙරෙන සංචාරක ව්‍යාපාර නිසාද, සංස්කෘතික හුවමාරු වැඩසටහන් මඟින්ද මෙම කලා ප්‍රවනතා අනුව දශකයේ සිට රට තුල ව්‍යාප්තවීම ප්‍රබලව සිදුවූ බව දක්නට ලැබුණි. එමෙන්ම බටහිර සමාජ නර්තන ජනප්‍රිය සංස්කෘතියේ අංග බවට පත්වීමට හා සීඝ්‍රයෙන් ලංකාව තුළද විසරණය වීමට බටහිරින් ආගමනය වූ චිත්‍රපට, ගීත සඳහා නිර්මාණය වූ රූප රචනා ක්‍රමවේදයන්ද සංගීතයද හේතුවිය.

බටහිර සමාජ නර්තන ලංකාව තුළ සාමාන්‍ය තලයේ නර්තන කලාවක් බවට තවම පත්වී නැත. මෙම පර්යේෂණ නිබන්ධනය සිදු කිරීමට මා පෙළඹ වූ ප්‍රධාන හේතුව වූයේ ද එයයි. නර්තන ඉතිහාසය පිළිබඳ බොහෝ කරුණු ලියවී ඇති හෙයින් එයින් බැහැරව ''නර්තනය'' යන පදයෙහි අර්ථය පිළිබඳවත්, බටහිර සමාජ නර්තනවල ඉතිහාසය, විකාශනය වූ ආකාරය පිළිබඳවත්, බටහිර සමාජ නර්තන පිළිබඳ මෙන්ම ඒවා අතර ප්‍රමුඛස්ථානයක් උසුලන නර්තන ශෛලීන් අතුරින් තෝරා ගත් කිහිපයක් පිළිබඳ සාකච්ඡා කිරීමටත්, බටහිර සමාජ නර්තනයන්ගේ කලාත්මක හා තාක්ෂණික භාවිතාව පිළිබඳ විමර්ශනයට ලක්කිරීමටත් මෙම නිබන්ධනය තුළින් අපේක්ෂා කරමි.

තවද ලාංකේය නර්තන සංස්කෘතිය පිළිබඳ කෙටියෙන් හැඳින්වීමටත්, බටහිර සමාජ නර්තන ලංකාවට සංක්‍රමණය වූ ආකාරය විමර්ශනය කිරීටමත්, ලාංකේය සමාජය තුළ මෙම නර්තන හැඩගැසී ඇති ආකාරය,

* රූපවාහිනී නාලිකා
* තරඟ හා ඇගයීම්

යටතේ සාකච්ඡා කිරීමටත් මෙම නිබන්ධනය තුළින් අපේක්ෂා කරමින් බටහිර සමාජ නර්තන පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථවල හිඟකම මෙවැනි පර්යේෂණයක් කිරීමට මා පෙළඹවූ ප්‍රධාන කරුණකි. මේ ආකාරයෙන් බටහිර සමාජ නර්තන පිළිබඳ සහ එම නර්තන ශ්‍රී ලංකාව තුළ භාවිතාවන ආකාරය පිළිබඳ විචාරාත්මක ලෙස අධ්‍යනයක යෙදීමට අපේක්ෂා කරමි.